# මාධ්‍ය නිවේදනය

## කාර්මික නිෂ්පාදන දර්ශකය

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011-2147401** **ෆැක්ස්: 011-2147412** **2016 ජුනි 29**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය ගණනය කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව මෙම දර්ශකයේ මාසික අගයන් කාර්තුමය වශයෙන් ගණනය කරනු ලබන අතර දින 63 ක කාල පරතරයකට පසුව නිකුත් කරනු ලැබේ. කර්මාන්ත අංශයේ වර්ධනය මැනීමට වඩාත් ම සුදුසු දර්ශකයක් ලෙස කාර්මික නිෂ්පාදන දර්ශකය හැඳින්විය හැකි අතර මෙම දර්ශකය මඟින් කර්මාන්ත අංශයේ නිෂ්පාදන ධාරිතාවෙහි කෙටි කාලීන වෙනස්වීම් හඳුනා ගත හැකිය. තව ද මෙමඟින් ආර්ථික සංවර්ධනයේ හැරවුම් ලක්ෂ්‍ය හඳුනා ගත හැකිය. 2015 පදනම් වර්ෂය ලෙස ගෙන ගණනය කරන ලද මෙම දර්ශකයෙහි අගයන් වෙනස් පදනම් වර්ෂ සහිත දර්ශක සමඟ සැසැඳිය නොහැක.

මෙම දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ 2015 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයෙහි දත්ත දර්ශකයෙහි බරිත අගයන් ගණනය කිරීමට භාවිත කරන ලද අතර නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි එකතු කළ අගය පදනම් කරගෙන බරිත අගයන් ගණනය කරන ලද බව 2016 පළමු කාර්තුවට අදාළ කාර්මික නිෂ්පාදන දර්ශකය නිකුත් කිරීමේ නිල නිවේදනය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාල්ඛන අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා ප්‍රකාශ කළේ ය. ඒ අනුව නිෂ්පාදන කර්මාන්ත අංශයට ආහාර නිෂ්පාදන අංශයෙන් සඳහා ඉහළම දායකත්වය (35.2%) වාර්තා වූ අතර ඇඟලුම් නිෂ්පාදන (19.8%) සහ ලෝහ නොවන ඛණිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය (7.8%) පිළිවෙලින් දෙවන සහ තෙවන ස්ථාන ගෙන ඇත.

2016 වර්ෂයේ පළමු කාර්තුවට නිකුත් කරන ලද දර්ශක අගයන් අනුව 2015 වර්ෂයේ සාමාන්‍ය මාසික නිෂ්පාදනයට සාපේක්ෂව, 2016 ජනවාරි මස නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාවයෙහි 3.4% වර්ධනයක් වාර්තා වේ. 2016 පෙබරවාරි සහ මාර්තු මාස වල එහි වර්ධනය පිළිවෙලින් 1.9% සහ 8.7% විය. ඒ අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ පළමු කාර්තුව තුළ නිෂ්පාදන කාර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාවය 4.7% කින් වර්ධනය වී ඇත.

**කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100)**

| වර්ෂය සහ මාසය | දර්ශක අගය (2015=100) |
|---|---|
| 2016 ජනවාරි | **103.4** |
| 2016 පෙබරවාරි | **101.9** |
| 2016 මාර්තු | **108.7** |
| 2016 පළමු කාර්තුව | **104.8** |

තව ද, 2015 සාමාන්‍ය මාසික නිෂ්පාදනයට සාපේක්ෂව 2016 ජනවාරි මස පිරිපහදු කළ ඛණිජ තෙල් නිෂ්පාදන(22.9%) වල සහ රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදනවල (24.9%) කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ. 2016 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාස වල ආහාර නිෂ්පාදන අංශයෙහි පිළිවෙළින් 1.1%, 0.8% සහ 3.0% ක වර්ධනයක් වාර්තා වේ. නමුත් 2016 ජනවාරි සහ පෙබරවාරි යන මාස වල බීම වර්ග නිෂ්පාදන අංශයෙහි අඩුවීමක් වාර්තා වුව ද 2016 මාර්තු මස 14.7% ක වර්ධනයක් වාර්ථා වේ. ඒ අනුව 2016 පළමු කාර්තුවෙහි ආහාර නිෂ්පාදන අංශය සහ බීම වර්ග නිෂ්පාදන අංශය පිළිවෙලින් 1.6,% ක සහ 0.2% ක වර්ධනයක් වාර්තා වේ. ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි 2016 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාස වල පිළිවෙලින් 5.8%, 7.1% සහ 7.6% ක වර්ධනයක් වාර්තා වන අතර මෙම අංශයෙහි 2016 පළමු කාර්තුවෙහි වර්ධනය 6.8% කි. (මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.statistics.gov.lk/Industries)

ආචාර්ය ඒ.ජේ.සතරසිංහ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්